**පිටබැද්දර ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය.**

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 27 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට **පිටබැද්දර** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | ------------ | ----------------- |
| (i) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ගෙවිය යුතු වියදම් රු.111,300 ක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | කඳුරුවාන බටගොඩ මාර්ගය සංවර්ධන සඳහා රු.50,000 මුදලක් ණයහිමි ප්‍රති පාදන සළසා ඇති අතර,එම කර්මාන්තය සඳහා ගෙවීම් රු.48,300 මුදල 2019 පෙබරවාරි 21 දින ගෙවීම් සිදු කරමි. |
| (ii) | මොරවක සතිපොළ ඉඩමෙහි දැල් ආවරන සහිත වැට සකස් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.267,036 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කරමි |
| (iii) | දෙනගම කන්ද බෝගහවත්ත පාර සංවර්ධනය කිරීමට අදාලව රු.25,000 ක් සහ සෘජු ශ්‍රම පදනම මත ඉටු කරන ලද කර්මාන්ත 04 ක් වෙනුවෙන් | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | සෘජු ශ්‍රමයට සිදු කරනු ලබන කර්මාන්තයන්ගේ ගෙවීම් වෙනස් වීම් වලට ලක්විය |

| | | |
|---|---|---|
| රු.68,025 ක් ණයහිමි යටතේ වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | | හැකි අතර ඉතිරි වන ප්‍රතිපාදනයන්ට අදාළ මුදල පොදු අරමුදලට බැර කරමි. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.69,511,567 ක් වූ ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.38,507,984 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අදාළ ශේෂ වෙනස්කම් නිවැරදි කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.2,073,466 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2008 වර්ෂයේ සිට වර්ෂ ගණනාවක් තිස්සේ පවතින වටිනාකම් වන අතර ඒ සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් උප ලේඛනද නොපවතී. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ 03 ක කාලයක් ඉක්ම වූ රු.131,549 ක තැන්පත් ශේෂ 10 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | තැන්පත් ආදායමට ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/ පපාකො/ 2010 /1 දරන චක්‍රලේඛයේ 05 ඡේදය | සභාව සතු කඩකාමර 40 ක ගිවිසුම් වසර 03 කට වරක් යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී සියළු ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.8,098,366 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.5,503,867 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2018** | | | | **2017** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,453,750 | 1,468,827 | 780,892 | 953,376 | 1,158,750 | 1,452,395 | 1,444,348 | 265,441 |
| කුලී | 4,981,000 | 11,176,728 | 11,199,626 | 1,639,560 | 4,448,000 | 5,715,998 | 5,256,984 | 1,662,458 |
| බලපත්‍ර ගාස්තු | 263,100 | 387,178 | 379,178 | 78,522 | 305,100 | 312,923 | 312,923 | 70,522 |
| වෙනත් ආදායම් | 11,915,500 | 9,204,520 | 9,025,283 | 16,593,834 | 10,821,000 | 12,134,615 | 9,376,183 | 16,414,597 |
| **එකතුව** | 18,613,350 | 22,237,253 | 21,384,979 | 19,265,292 | 16,732,850 | 19,615,931 | 16,390,438 | 18,413,018 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම රු.18,613,350 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආරම්භයට තිබූ රු.18,413,018 ක හිඟ මුදල හා බිල්කිරීම් රු.22,237,253 ක් සමඟ රු.40,650,271 ක් අයවීමට තිබූ අතර වර්ෂය තුළදී මුළු අයවීම් රු.21,384,979 ක් පමණක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුදල රු.19,265,292 ක් විය. අයවීම් ප්‍රගතිය සියයට 53 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | විගණන නිරීක්ෂණය පිළිගනිමි. |

### 2.2.3 වරිපනම් හා බදු

**(අ) වරිපනම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2010 පෙබරවාරි 28 දිනැති අංක 1824 දරන ගැසට් නිවේදනය මගින් සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 10 ක් දියුණු ප්‍රදේශ ලෙස ප්‍රකාශකර තිබුණද, 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සභාව විසින් වරිපනම් බදු අයකිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර නොතිබුණි. | වරිපනම් බදු අයකිරීමේ ක්‍රියාවලිය කඩිනමින් සිදුකළ යුතුවේ. | වරිපනම් බදු අය කිරීම සඳහා වරිපනම් බදු කලාපයක් හඳුනාගෙන ඒ සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කර ඇත. |

**(ආ) අක්කර බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආරම්භක හිඟ අක්කර බදු ශේෂය රු.264,039 ක් වූ අතර, රු.31,943 ක් වූ වර්ෂයේ බිල් කිරීම් සමඟ රු.295,982 ක් අයවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ මුළු අයවීම් 30,412 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.265,570 ක් හිඟව පැවතුණි. අයවීමේ ප්‍රගතිය සියයට 10 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතුවේ. | හිඟ මුදල් අය කර ගැනීමට ක්‍රියා මාර්ග ගෙන ඇත. |

### 2.2.4 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ආරම්භක හිඟය රු.818,761 ක් වූ අතර, රු.1,759,100 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.2,577,861 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.1,635,612 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.942,249 ක හිඟ ශේෂයක් පැවතුණි. අයවීමේ ප්‍රගතිය සියයට 63 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉතිරි බදුකරුවන්ට අදාළව සමථ මණ්ඩලයේ වාර්තාද පදනම් කර ගනිමින් නඩු පැවරීමට කටයුතු කරමින් පවතී. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.942,249 ක් වූ ලැබිය යුතු කඩ කුලී ආදායම තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්ම වූ රු.169,636 ක ශේෂ ඇතුළත්ව පැවතුණි. හිඟ ආදායම් අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | කඩකාමර සභාව සතු කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

### 2.2.5 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 200 කින් රු.531,965 ක ගාස්තුවක් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | මේ වන විට රු.63,575 ක මුදලක් දැන්වීම් පුවරු ගාස්තු ලෙස අයකර ගෙන ඇති අතර ඉතිරි මුදල්ද අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

### 2.2.6 වෙනත් ආදායම්

**ජල ගාස්තු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.1,186,705 ක ලැබිය යුතු ජල ගාස්තු ආදායම තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්ම වූ රු.572,778 ක ශේෂ ඇතුළත්ව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | මෙම ජල ව්‍යාපෘති කාලයක් තිස්සේ අක්‍රිය තත්වයේ පවතින අතර, හිඟ මුදල් අයකර ගැනීමට නොහැකිවේ. අදාල හිඟ මුදල් කපා හැරීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ii) | ආරම්භක හිඟ ශේෂය රු.958,393 ක් වූ අතර, රු.1,103,075 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.2,061,468 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.879,070 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.1,182,398 ක හිඟ ශේෂයක් පැවතුණි. අයවීමේ ප්‍රතිශතය සියයට 43 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | දීර්ඝ කාලීන හිඟ ශේෂයන්ගේ වටිනාකම් මෙම හිඟ ශේෂ වල පැවතීම හා 2018 දෙසැම්බර් මසට අදාල බිල් කිරීම් වටිනාකම ඉහළ අගයක් ගැනීම මෙයට හේතුවේ. |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී ජල සම්බන්ධතා විසන්ධි කළ පාරිභෝගිකයින් 15 දෙනෙකුගෙන් රු.44,917 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | මෙම ජල ව්‍යාපෘතිය 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක තත්වයේ නොමැති අතර ජලය සැපයීම් කටයුතු දීර්ඝ කාලීනව සිදු නොවූ බැවින් අය කර ගැනීම් කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත. ඉදිරියේදී හිඟ ආදායම් කපා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

**2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.1,078,522 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.14,328,608 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ දඩ හා ගාස්තු මුදල් කඩිනමින් අයකළ යුතුවේ. | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ මුද්දර ගාස්තු වලින් රු.3,184,770 ක මුදලක් 2019 පෙබරවාරි 05 වන දින වන විට ලැබී ඇත. |

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ | තිරසර සංවර්ධන | ජනතාවගේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගී සේවා පොදු මංමාවත් පාලනය |

| | | |
|---|---|---|
| ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමට වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කළ යුතුවේ. | කිරීමේදී සියළු මහජනතාවට එකසේ භුක්තිවිඳිය හැකිසේ කාර්යාල, පෙරපාසල් සහ පුස්තකාල පිහිටා ඇති අතර,බල ප්‍රදේශයේ සියළුම ග්‍රාමීය මාර්ග ආවරණය වන පරිදි සභාව සතු යන්ත්‍ර උපයෝගී කර ගනිමින් සංවර්ධන කටයුතුද සිදු කෙරේ. රුක් රෝපණ වැඩසටහන් ආදිය සෑම ප්‍රදේශයක්ම ආවරණ වන පරිදි ක්‍රියාවට නංවා ඇත. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 09 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 07 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණකර ගත යුතුවේ. | ප්‍රාථමික තනතුරු 05 ක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා අනුමැතිය ලබාගැනීමට ප්‍රධාන ලේකම් කාර්යාලයට යොමු කර ඇත. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුර නැගුම ව්‍යාපෘතිය යටතේ පිටබැද්දර පැරණි පොදු වෙළඳපොළ ඉවත්කර රු.23,968,124 ක වියදමක් දරා ඉදිකර තිබූ කඩ කාමර 14 ක් පැරණි බදු කරුවන් වෙත ලබාදී තිබූ අතර, කඩ කාමර බදු ගත් බදු කරුවන් හතර දෙනෙකුගෙන් එකවර අයවිය යුතු රු.350,000 ක් අයවී නොතිබුණි. බදු ගිවිසුම් ප්‍රකාරව එහි සන්තකය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් ඉක්මනින් අය කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

**3.4 වත්කම් කළමණාකරණය**

**3.4.1 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016 වර්ෂයේදී පුර නැගුම ව්‍යාපෘතිය මඟින් රු.4,124,487 ක වියදමින් පිටබැද්දර පොළ භූමියෙහි ඉදිකර තිබූ වැසිකිළි පද්ධතිය ආදායම් ඉපිදවීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි. | සභා දේපලවලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුවේ. | පොදු වැසිකිළිය දෛනික භාවිතා කරනු ලබන පුද්ගලයින් සංඛ්‍යාව අඩු මට්ටමක පවතින බැවින් ටෙන්ඩර් කිරීමට කටයුතු නොකරන ලද අතර, එය සභාව විසින් මහජන උපයෝගීතා සේවාවක් සේ සලකා ක්‍රියා කරමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වැය විෂයන් 07 ක ඉතිරිවීම් වල එකතුව රු.4,881,604 ක් වූ අතර එම අගයන් සියයට 06 සිට සියයට 78 දක්වා පරාසයක පැවතුණි. | ඇස්තමේන්තු තාත්විකව පිළියෙල කළ යුතුවේ. | නොයෙකුත් හේතූන් මත වැය විෂයන්ගේ ඉතිරිවීම් තිබුණි. |
| (ආ) | අදායම් විෂයන් 03 ක ළඟාකර නොගත් ඉලක්කවල එකතුව රු.4,493,755 ක් වූ අතර එම අගයන් සියයට 04 සිට 30 දක්වා පරාසයක පැවතුණි. | ඇස්තමේන්තු තාත්විකව පිළියෙල කළ යුතුවේ. | අපේක්ෂිත ආදායම් නියමිත පරිදි නොලැබුණි. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | අභ්‍යන්තර විගණන රාජකාරී වලට අමතරව වාර්ෂික අය වැය සකස් කිරීම, වාර්ෂික අවසන් ගිණුම සකස් කිරීම, වවුචර් පරික්ෂාව, විගණන විමසුම් සම්බන්ධ කටයුතු කිරීම ආදී රාජකාරිද ඉටුකිරීමට පවරා ඇත. |